# 20

# කලීෆා උස්මාන් රළියල්ලාහු අන්හු තුමා

" أَلا أَسْتَحِي مِنْ رَجُلٍ تَسْتَحِي مِنْهُ الْمَلائِكَةُ " (رواه مسلم)

**"දේවදූතයන් පවා එතුමා දැක ලැජ්ජාශීලී වන විට මා ලැජ්ජාශීලී නොවිය යුත්තේ මන් ද ? " (මුස්ලිම්)**

## කලීෆා උස්මාන් රළියල්ලාහු අන්හු තුමා

උස්මාන් රළියල්ලාහු අන්හු තුමා කුරෛෂි ගෝත්‍රයේ ප්‍රධානතම වංශයන්ගෙන් එකක් වන උමෙයියා වංශයේ ක්‍රි. පූ. 576 වන වසරේ උපත ලැබී ය. දක්ෂ‍ කල්පෙනුමක් හා ලැජ්ජාශීලි ස්වභාවයක් ඇති මෙතුමා, තම පියාගේ මාර්ගයෙන් යමින් ප්‍රබල ව්‍යාපාරිකයන්ගෙන් කෙනකු ලෙස ද, ධනවතකු ලෙස ද වැජඹුණේ ය. ඔහු සාක්ෂරතාව, සාහිත්‍ය ආදියෙහි විශේෂ දැනුමක් ඇත්තෙක් විය. බුද්ධිමත් හා උසස් පෞරුෂත්වයකින් හෙබි මෙතුමා දන් දීමෙහි ප්‍රියබවක් දැක්වී ය. එැබැවින් කුරෛෂිවරුන් අතර මොහුට උසස් ගෞරවයක් හිමි විය.

ඉස්ලාමයට ප්‍රවේශ වූ ප්‍රථම දස දෙනා අතර කෙනකු වන උස්මාන් රළියල්ලාහු අන්හු තුමා, අබූබක්ර් රළියල්ලාහු අන්හු තුමාගේ ආරාධනාව පරිදි ඉස්ලාමය වැළඳ ගත්තේ ය. එවිට එතුමාගේ වයස අවුරුදු තිස් හතරකි. එදා පටන් ඉස්ලාමය ඇදහීමෙහි ද ප්‍රචාරය කිරීමෙහි ද මුළුමනින් ම නියැළුණේ ය. ඒ සඳහා තම ධනය ද අප්‍රමාණ ව වියදම් කළේ ය.

### පෞරුෂ පක්ෂනය

නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණන් සමග සිට සෑම කටයුත්තකට ම සහභාගි වූ මෙතුමා, සහාබාවරු අතර අබූබක්ර් රළියල්ලාහු අන්හු, උමර් රළියල්ලාහු අන්හු යන දෙදෙනාට පසු වැදගත් ලෙස සලකන ලදි. නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම්

තුමා විසින් කිහිප වරක් ම ස්වර්ග වරම හිමිකරගත් අය වන "අෂ්රතුල් මුබෂ්ෂරාහ්" යැයි හැඳින්වෙන ස්වර්ගයට ප්‍රවේශ වීමේ සුභ ආරංචිය ලද දස දෙනාගෙන් කෙනෙකු ලෙසට මෙතුමා ද පත් කරන ලද්දේ ය. සාක්ෂරතාව ඇති කෙනෙකු වන බැවින් 'වහී' ලේඛණ ගත කිරීමෙහි ද මෙතුමා නිරත විය.

නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණන්ගේ දියණියන් දෙදෙනකු, එක් දියණියක් වෆාත් වූ පසු අනෙක් දියණිය ලෙසට විවාහ කර ගෙන සාර්ථක විවාහ ජීවිතයක් ගත කිරීම නිසා "දුන්නූරයින්" (ආලෝක දෙකක් හිමි) යන ගෞරව නාමයෙන් ආමන්ත්‍රණය කරනු ලැබී ය. "දෙවදූතයන් ලැජ්ජාශීලි වන කෙනකු සමග මා ලැජ්ජාශීලී නොවිය යුත්තේ මන් දැයි," (මුස්ලිම්) නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමා පැවසීම මොහුගේ ලැජ්ජාශීලි ස්වාභාවයට කදිම සාධකයකි.

මුස්ලිම්වරු විසින් සිදු කරන ලද පළමු හිජ්රතයේ ද අනෙකුත් හිජ්රතයන්හි ද සහභාගී විය. හිජ්රි හය වන වසරෙහි සිදු වූ උම්රා ගමනෙහි දී නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ගේ සාම දූතයකු ලෙස යවනු ලැබී ය.

මෙලෙස නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමා සමග එක් වී කටයුතු කළ මෙතුමා කලීෆා අබූබක්ර් රළියල්ලාහු අන්හු තුමාණන්ගේ පාලනයෙහි 'ෂූරා' නම් සභාවේ ප්‍රධාන සාමාජිකයකු ලෙස ඇමතිවරයකුගේ ස්ථානයෙහි ලා කටයුතු කළේ ය. කලීෆා උමර් රළියල්ලාහු අන්හු තුමාණන්ගේ කාලයේ ද එතුමාට ඉතා සමීප ව සිට උපදෙස් ලබා දී පාලන කටයුතු සඳහා සහාය දැක්වී ය.

## කලීෆා ලෙස පත්කරගත් ආකාරය හා සේවා

කලීෆා උමර්රළියල්ලාහු අන්හුතුමා අබූලුඃලූඃආගේ පහරදීමට ලක්ව අසාධ්‍යවූවිටඑහි රැස් ව සිටි සහාබාවරු එතුමා අමතා 'අමීරුල් මුඃමිනීන් තුමනි, අපහට වසීයියත් කරන්න, ඒ සමග ඔබට පසු කෙනකු කාලිෆා ලෙස පත් කරන්න' යැයි ඉල්ලා සිටියහ 'එයට වඩාත් සුදුස්සා ලෙස (ස්වර්ගයට ප්‍රවේශ වීමේ පොරොන්දුව ලත්) සය දෙනාගෙන් කෙනකු මම දකිමි, යැයි පවසා උස්මාන්, අලි, තල්හා, සුබෙයිර් අබ්දුල් රහ්මාන් ඉබ්නු අවුෆ්, සඃද් ඉබ්නු අබී වක්කාස් රළියල්ලාහු අන්හුම් ආදී වශයෙන් වන හය දෙනා නම් කළහ. තමන් අතරින් කෙනෙකු පත් කර ගන්නා ලෙස ඔවුන් දැනුම්වත් කළහ.

උමර් රළියල්ලාහු අන්හු තුමා වෆාත් වී භූමදාන කටයුතු කළ පසු නම් කළ සය දෙනා රැස් වුහ. දීර්ඝ අදහස් හුවමාරුවකට පසු උස්මාන් රළියල්ලාහු අන්හු තුමා කලීෆා ලෙස තෝරා පත් කර ගනු ලැබිණි. ප්‍රථමයෙන් අබ්දුල් රහ්මාන් රළියල්ලාහු අන්හු තුමා බයිඅත් කළ පසු සෙසු සහාබාවරු ද බයිඅත් කළහ.

## සේවාව හා දයකත්වය

### 1. අල් කුර්ආනය ආරක්ෂා කිරීම

උස්මාන් රළියල්ලාහු අන්හු තුමා නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමා අසල සිට වහී සටහන් කරන "කුත්තාබුල් වහී" කෙනකු ලෙස සේවය කළහ. පසු කාලයේ අරාබි නොවන බොහෝ පිරිස් ඉස්ලාමය වැළඳගත් හෙයින් අල් කුර්ආනය පාරායනය කිරීමෙහි ලා ඔවුන් අතර වෙනස්කම් ඇති විය. එබැවින් කලීෆා අබූබක්ර් රළියල්ලාහු අන්හු තුමාගේ කාලයේ දී එක්රැස් කර, හෆ්සා රළියල්ලාහු අන්හා තුමිය විසින් ආරක්ෂා කරමින් පැමිණි. අල් කුර්ආන් පිටපත පදනම් කරගෙන පිටපත් අටක් උස්මාන් රළියල්ලාහු අන්හු තුමා විසින් සකස් කළේ ය. නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණන්ගේ කාලයේ අල් කුර්ආනය ලේඛනගත කිරීමේ කමිටුවේ නායකයා වශයෙන් ද අත්දැකීම හා අනුමැතිය ලත් සෙයිද් බින් සාබිත් රළියල්ලාහු අන්හු තුමාගේ නායකත්වයෙන් මෙම සේවය ද සිදු විය. කලීෆා තුමා එම පිටපත් අල්කුර්ආනය නිවැරදි ලෙස පාරායනය කරන කාරිවරුන් අත යවා තැබූහ. මෙමගින් නිවැරදි ව පාරායනය කිරීමෙහි ඇති වූ වෙනස්කම් නැති කර සියලු දෙනා ඒකාකාර ව පාරායනය කිරීමේ හැකියාව ස්ථාපිත කළේ ය. මෙය හේතුකොට ගෙන එතුමාට "ජාමිඋල් කුර්ආන්" යන ගෞරව නාමය හිමි විය.

### 2. නාවික හමුදාව පිහිටුවීම

ඉස්ලාමීය ධර්ම සංදේශය අරාබි අර්ධද්වීපයෙන් පිටත රැගෙන යෑමටත් සතුරන්ගෙන් ඇති වූ තර්ජනවලට මුහුණ දීමටත් නාවික හමුදාවක් පිහිටුවීමට සම්පූර්ණ අනුග්‍රහය ද ඒ සඳහා සහයෝගය ලබා දුන්නේ ය. ෂාම් දේශයේ ආණ්ඩුකාරවරයකු ලෙස සේවය කළ මුආවියා රළියල්ලාහු අන්හු තුමාගේ නායකත්වය යටතේ හිජ්රි 26 වන වසරේ දී මෙය ස්ථාපිත කරන ලදි.

### 3. පාලන ව්‍යාප්තිය

පෙර සිටි කලීෆාවරු දෙදෙනාගේ කාලයේ පවත්වාගෙන යන ලද ආරක්ෂක ක්‍රමවේද එලෙස ම පවත්වා ගෙන යන ලදි. මෙතුමාගේ පාලන සමයේ ඇලෙක්සැන්ඩ්‍රියාව, ඊජිප්තුවේ දකුණු ප්‍රදේශය, ටියුනීසියාව, මොරොක්කොව වැනි රටවල බොහෝ ප්‍රදේශවල ද, මධ්‍යධරණී මුහුදු තීරයේ දූපත්වල ද, පර්සියානු ප්‍රාන්තවල ද, ඉස්ලාමීය පාලනය ව්‍යාප්ත විය.

### 4. දේශපාලනමය දායකත්වය

දේශපාලනික වශයෙන් ද ඉස්ලාමීය දැක්ම ලොවට විවිධාකාර වූ දායකත්වයන් ලබා දෙන ලදි. පෙර සිටි කලීෆාවරුන් දෙදෙනා විසින් ගන්නා ලද පාලන ක්‍රමයට අවශ්‍ය වෙනස්කම් සිදු කරමින් ඉතා ශ්‍රේෂ්ඨ පාලනයක් මෙතුමා විසින් ගෙන යන ලදි.

## 5. සංවර්ධනයේ දායකත්වය

හිජ්රි 26 වන වසරේ මස්ජිදුල් හරම් ද හිජ්රි 29 වන වසරේ මස්ජිදුන් නබවි ද විශාල කරන ලදි. බෙයිතුල්මාල්හි සේවය ව්‍යාප්ත කරන ලදි. ඇලමාර්ග, මහා මාර්ග ඉදිකිරීම, පොදු ළිං කැනීම ආදී ප්‍රාථමික අවශ්‍යතා සඳහා දැඩි මැදිහත්වීමක් පෙන්වන ලදි.

මෙලෙස විසිරී ව්‍යාප්ත වී ගිය රාජධානිය පාලනය කළ කලීෆා තුමා පාලන තන්ත්‍රයට ගැළපෙන පරිදි වෙනස්කම් රාශියක් ඇති කළේ ය. එහෙත් මෙය වරදවා අවබෝධ කර ගත් සතුරෝ මුස්ලිම්වරු අතර කැරැල්ලක් ඇති කර ඉස්ලාමීය දේශපාලනය බෙලහීන කර තම සැලසුම් ඉටු කර ගැනීමට උත්සාහ දැරූහ. මෙහි යථාර්ථය අවබෝධ කර නොගත් මුස්ලිම්වරුන්ගෙන් පිරිසක් මෙම උගුලට අසු වූහ. මෙම කැරැල්ල ඇති කිරීමට අබ්දුල්ලා ඉබ්නු සබා නම් යුදෙව්වා මහත් උනන්දුවක් දැක්වී ය.

මෙමගින් ඇති වූ ගැටලු නිසා කැරළිකරුවෝ විසින් කලීෆා උස්මාන් රළියල්ලාහු අන්හු තුමාණන් වට කර ඔහුගේ වයස අවුරුදු 82 දී, හිජ්රි 35 වන වසරේ දී ඝාතනයට ලක් කළෝ ය.

**පාඩමේ ඇතුළත් වැදගත් අරාබි වචන**

❁ العَشَرَةُ المُبَشَّرَةُ ❁ كَاتِبُ الوَحْيِ ❁ جَامِعُ الْقُرْآنِ ❁ ذُو النُّورَيْنِ

### අභ්‍යාසය

1. කලීෆා උස්මාන් රළියල්ලාහු අන්හු තුමා දුන්නූරයින් යනුවෙන් හැඳින්වීමට හේතු වූයේ කුමක් ද?
2. අල් කුර්ආනයට උස්මාන් රළියල්ලාහු අන්හු තුමා කළ සේවා විස්තර කරන්න.
3. ඉස්ලාමීය ලෝකයේ ප්‍රථම නාවික හමුදාව ස්ථාපිත කිරීමේ ගෞරවය ඔහු සතු ය. මේ ගැන ඔබ උගත් පාඩම අනුග්‍රහයෙන් විස්තර කරන්න.